අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education
Isurupaya, Battaramulla, Sri Lanka.
94112785141-50 | 94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. ED/01/11/07/07- 2026 | ඔබේ අංකය / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2026 .04. 28. |

**චක්‍රලේඛ අංක : 15 /2026**

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලා
සියලුම සීලමාතා ආයතනාධිපති වහන්සේලා
සියලුම විදුහල්පතිවරුන්

## ශ්‍රී බුද්ධ වර්ෂ 2570 වන වෙසක් සතිය

2026 මැයි මස 30 වන දිනට යෙදී ඇති ශ්‍රී බුද්ධ වර්ෂ 2570 වන වෙසක් දිනය නිමිත්තෙන් රාජ්‍ය වෙසක් උත්සවය 2026 මැයි මස 27 වන දින මාතර දිස්ත්‍රික්කයේ, මාතර, තිහගොඩ, මිදෙල්ලවල පුරාණ විහාරස්ථානයේ දී පැවැත්වීමට බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හා බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව කටයුතු යොදා ඇත.

රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමීව, "වෙසක් සතිය" වැඩසටහන, අදාළ පාසල්, විද්‍යාපීඨ, පිරිවෙන් හා ගුරු විද්‍යාල පරිශ්‍රයන්හි, 2026.05.26 වන දින සිට 2026.06.02 වන දින දක්වා ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු සංවිධානය කළ යුතු වේ.

මෙම වෙසක් සතිය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ආදර්ශ සැලැස්ම (බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ නිර්දේශ ද සැලකිල්ලට ගෙන) පහතින් ඉදිරිපත් කර ඇති අතර, එම වැඩසටහන් අදාළ පාසල් සහ අධ්‍යාපන ආයතනවල සුදුසු පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු සලසන මෙන් දන්වමි.

**යෝජිත වෙසක් සතියේ ආදර්ශ වැඩ සැලැස්ම.**

| දිනය | තේමාව | යෝජිත ක්‍රියාකාරකම් |
|---|---|---|
| 2026 මැයි මස 26 වන අඟහරුවාදා | **සෞඛ්‍ය සම්පන්න ජීවිතයක්** | • සම්බුද්ධ දේශනාවන්ට අනුව සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම |
| 2026 මැයි මස 27 වන බදාදා | **සාරධර්ම ප්‍රවර්ධන වැඩසටහන්** | • බෞද්ධ සිරිත් විරිත්වල වටිනාකම පිළිබඳ පාසල් හා දහම් පාසල් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් හා උපදේශන වැඩසටහන් පැවැත්වීම.<br>• වැඩිහිටි නිවාස, ළමා නිවාස, රෝහල් වැනි සුවිශේෂී ස්ථානවල සත්කාරක වැඩසටහන් පැවැත්වීම.<br>• මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් හා ශිෂ්‍ය උපදේශන වැඩ සටහන් සංවිධානය කිරීම. |
| 2025 මැයි මස 29 වන සිකුරාදා | **ආමිස පූජාමය වැඩසටහන්** | • වෙසක් පහන් කූඩු හා විවිධ නිර්මාණ කිරීම සහ සැරසීම. (බලශක්තිය අරපිරිමැස්මෙන් භාවිතයට අවධානය යොමු කළ යුතුයි.) |

| | | |
|---|---|---|
| 2026 මැයි මස 30 වන සෙනසුරාදා (වෙසක් පුර පසළොස්වක පොහෝ දිනය) | "කායික වාචසික සංවරය සීලයයි" තේමාව යටතේ ශීල භාවනා වැඩසටහන් සංවිධානය | • වෙසක් පුර පසළොස්වක පොහෝ දිනයේ, දෙමවුපියන් සහ වැඩිහිටියන් සමඟ ආසන්නතම විහාරස්ථානයේ දී හෝ නිවසේදී සිල් සමාදන් වීම හෝ සිල් සමාදන් වූ උවැසි උවැසියන්ට උපස්ථාන කිරීම.<br>• වෙසක් පහන් කූඩුවලින් නිවස අලංකාර කර ආමිස පූජා සිදු කිරීම. |
| 2026 මැයි මස 31 වන ඉරිදා | සංස්කෘතික වැඩසටහන් සංවිධානය | • වෙසක් බැති ගී ගායනා හා බෞද්ධ නාට්‍ය වැනි සෞන්දර්යාත්මක වැඩසටහන් වැඩිහිටියන් සමඟ සංවිධානය, සහභාගී වීම, නැරඹීම සහ රසාස්වාදයේ යෙදීම. |
| 2026 ජුනි මස 01 වන සඳුදා | අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් සංවිධානය | • බුද්ධානුස්සති භාවනාව, ධම්මානුස්සති භාවනාව, සංඝානුස්සති භාවනාව, සීලානුස්සති භාවනාව, මෛත්‍රී භාවනාව වැනි භාවනාවන් පුහුණු කිරීම<br>• මානසික සුවතාවෙහි වටිනාකම සිසු සිසුවියන්ට අවබෝධ කර දීමේ වැඩසටහන් සංවිධානය කිරීම. |
| 2026 ජුනි මස 02 වන අඟහරුවාදා | " ක්ලීන් ශ්‍රී ලංකා " වැඩසටහනට සමගාමීව පරිසර සංරක්ෂණ වැඩසටහන් හා ශ්‍රමදාන සංවිධානය | • බුදුරජාණන් වහන්සේගේ දේශනයට අනුව පරිසර හිතකාමී පිරිසක් බිහි කිරීම සඳහා පරිසරයේ වටිනාකම හා පරිසරය රැක ගැනීම පිළිබඳව සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>• පාසල, ආයතනය, ආගමික සිද්ධස්ථාන, නිවෙස් අවට පිරිසිදු කිරීම<br>• රුක්රෝපණ වැඩසටහන් ඔසු උයන් වන උයන් පිහිටුවීම. |

ඉහත වෙසක් සතිය තුළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී, ආයතනික වශයෙන් සුදුසු ලෙස කාල වේලාවන් යොදා ගත හැකිය. කිනම් හේතුවක් නිසා හෝ බෞද්ධ ආගමට හෝ යම් ආගමකට නිගරු වන ආකාරයේ අදහස් දැක්වීම, විවිධ සංදර්ශන හා ක්‍රීඩා සහ එවැනි වෙනත් වැඩසටහන් පැවැත්වීම ආදියෙන් වැළකිය යුතු වේ. සිසු සිසුවියන් හා පාසල්/ආයතන ප්‍රජාව අතර ආගමික සංහිඳියාව ගොඩනැගෙන අයුරින් කටයුතු කිරීමට විදුහල්පතිවරුන් සහ ආයතන බලධාරින්ගේ අවධානය යොමු විය යුතුය.

නාලක කළුවැව
ලේකම්

පිටපත්:
1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය
2. ලේකම්, බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය } කරු.දැ.ගැ. සඳහා අ.ක.ස
3. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
4. අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) - සියලු ම පිරිවෙන් අධ්‍යාපන ආයතන දැනුවත් කිරීමට හා අ.ක.ස
5. ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) - සියලු ම විද්‍යාපීඨ වල පීඨාධිපතිවරුන් දැනුවත් කිරීමට හා අ.ක.ස
6. අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) - සියලු ම ජාතික පාසල් වල විදුහල්පතිවරුන් දැනුවත් කිරීමට හා අ.ක.ස